# ප්‍රසම්පාදන දැන්වීමයි

## වැලිමඩ ප්‍රාදේශීය සභාව

01.වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් වැලිමඩ ප්‍රාදේශීය සභාවට අයත් කැප්පෙටිපොල එරබද්ද මාර්ගයේ ඉදි කර ඇති වෙළඳ සංකීර්ණයේ බිම් මහලෙහි පහත සඳහන් කඩ කාමර බදු දීමට තීරණය කර ඇත. ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශව වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු. අං | කඩ කාමර අංකය හා විස්තරය | බදු කාලය | අවම ලංසු මුදල (රු) | මාසික බදු කුලිය (රු) | ආපසු ගෙවන ලංසු ඇප තැන්පතුව (රු) | ලංසු පෝරම ගාස්තු (රු) |
|---|---|---|---|---|---|---|
| 01. | 35 ( වර්ග මීටර් 16.87 කින් යුතු කඩ කාමරය) | වසර 30 | 2,300,000.00 | 10,000.00 | 230,000.00 | 10,000.00 |
| 02. | 36 ( වර්ග මීටර් 7.93 කින් යුතු කඩ කාමරය) | වසර 30 | 1,100,000.00 | 5,000.00 | 110,000.00 | 10,000.00 |

02.ව්‍යාපාරික කටයුතු සඳහා භාවිතයට ගනු පිණිස ඉහත දේපළ බදු ගැනීම සඳහා ප්‍රාදේශීය ගැනුම්කරුවන්ට ලංසු ඉදිරිපත් කළ හැකිය.

03.ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබා ගැනීමට, ලංසු ලියවිලි පරික්ෂා කිරීමට හා ලංසු ලියවිලි මිලට ගැනීම සඳහා වැලිමඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය ඇමතිය හැකිය.

දුරකථන අංකය 057 2245973
ෆැක්ස් අංකය 057 2245973
විද්‍යුත් තැපැල් ලිපිනය pswelimada@gmail.com

04.උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි මිලට ගැනීම සඳහා උපදෙස් :-

- 2026.02.24 වන දින පෙ.ව.9.00 සිට 2026.03.09 වන දින පෙ.ව.10.00 දක්වා රාජකාරි වේලාව ඇතුළත ඉල්ලුම් පත්‍ර වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය.
- ලංසු ගාස්තුව ගෙවීම වෙනුවෙන් නිකුත් කරන ලද කුවිතාන්සිය ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන් සම්පූර්ණ කරන ලද ලංසු :-

- සියලු ලංසු පිටපත් 2කින් ඉදිරිපත් කළ යුතු අතර ලංසුපත් බහාලන කවරයේ උඩ වම් කෙළවරෙහි **"වැලිමඩ ප්‍රාදේශීය සභාවට අයත් කැප්පෙටිපොල එරබද්ද මාර්ගයේ ඉදි කර ඇති වෙළඳ සංකීර්ණයේ බිම් මහලෙහි, අංක .......... කඩ කාමරය බදු ගැනීම සඳහා ලංසු ඉල්ලුම්පත"** යනුවෙන් සටහන් කළ යුතුය.

- 2026.03.10 දින පෙ.ව. 09.00ට පෙර සභාපති, ප්‍රාදේශීය සභාව, වැලිමඩ යන ලිපිනයට ලැබෙන සේ ලංසු ලියාපදිංචි තැපැලෙන් එවිය හැකිය. එසේ නොමැති නම් මුද්‍රා තැබූ ලංසු පත් එදින එකී වේලාවට ප්‍රථම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ලංසු පත්‍ර බහාලන පෙට්ටිය තුළට බහාලීමට කටයුතු කළ යුතුය. එදින එකී වේලාවට පසුව ලැබෙන ලංසු පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලැබූ ලංසු පත්‍රයේම පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු අතර එක් එක් දේපල සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කළ යුතුය.

06. 2026.03.10 දින ප.ව.9.30 ට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී ලංසු විවෘත කිරීමට නියමිත අතර ඒ සඳහා ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හට සහභාගී වීමට හැක.

2026. 02.24

වැලිමඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී

ඩී.එම්.අජිත් කුමාර

සභාපති

ප්‍රාදේශිය සභාව,

වැලිමඩ